CAT - II 2015

Level - 05

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම**
**අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2014/2015**
**පරිපාලන නීතිය - LWU3311**
**කාලය පැය එකයි.**

---

දිනය - 2015 නොවැම්බර් 12 වන දින වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.10.30 දක්වා

**එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**
**අපැහැදිළි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.**

01. රෙස්ටෝරියානු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගනු ලැබූ පහත ක්‍රියාමාර්ගයන්හි නෛතික භාවය සාකච්ජා කරන්න. ඔබේ පිළිතුර අදාළ අධිකාරීන් මගින් තහවුරු කළයුතු වේ.

රෙස්ටෝරියානු රාජයයේ අධිවේගී මාර්ග ඉදි කිරීමට අදාල ක්‍රියාමාර්ග ගැනිමට 1980 මාර්ග සංවර්ධන අධිකාරි පනත මඟින් රෙස්ටෝරියානු මාර්ග සංවර්ධන අධිකාරියට ( RDA) බලය ලබා දෙයි. පනතට අනුව අධිවේගී මාර්ග ඉදිකිරීම් සඳහා RDA විසින් අදාල අධිකාරීන් වෙතින් අනුමැතිය ලබා ගත යුතුය. පනතේ 5 වන වගන්තිය තවදුරටත් පහත පරිදි සඳහන් කරයි.

(අ) RDA විසින් රටතුල සිටින සුදුසුකම් ලත් ඉදිකිරීම්කරුවන් වෙතින් ටෙන්ඩර් සඳහා කැඳවීම් කළයුතුය.

(ආ) පිරිවැය ඵලදායිතාවය සඳහා සැලැස්ම විමර්ෂණය කළ යුතු අතර RDA හි අදාල අංශයන්ගෙන් ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතුය.

(ඇ) අවසාන පිරිවැය සාධාරණීකරණය කළ නොහැකි තරම් ඉහළ නම්, මෙවන් ව්‍යාපෘතීන් මඟින් ඉදිකරනු ලබන පාලම්වල දිග ඉවුරුවල උස සහ කැපුම් හි ගැඹුර පිළිබඳව අනිවාර්යයෙන් විමර්ෂණය කළ යුතුය.

(ඈ) ගිවිසුම අත්සන් කිරීමට පෙර පරිසර බලපෑම් තක්සේරුවක් සිදුකළ යුතුය.

උතුරු- දකුණු අධිවේගී මාර්ගය ඉදි කිරීමට RDA තිරණය කරයි.

RDA විසින් ටෙන්ඩර් කැඳවා රෙස්ටෝරියාවෙහි ABC ඉදිකිරීම් සමාගම සමඟ ගිවිසුමක් අත්සන් කරන ලදී. ඉදිකිරීම් ආරම්භ කිරීමෙන් මාස හයකට පසුව RDA විසින් ABC සමාගම සමඟ ඇති කරගෙන තිබූ ගිවිසුම අවසන් කර, රෙස්ටෝරියාවේ මහාමාර්ග කටයුතු

පිළිබඳ අමාත්‍යවරයා ප්‍රධාන කොටස්කරුවකු වන විදේශීය සමාගමක් සමඟ නව ගිවිසුමක් අත්සන් කළේය.

රාජ්‍යය සුරකිමු *(Save the State)* නම් සංවිධානයක් විසින් උතුරු දකුණු අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වලට එරෙහිව මහජන විරෝධතාවයක් සංවිධානය කරන අතර විරෝධතාවයට පහත කරුණු පදනම් වේ.

(අ) විදේශීය සමාගමක් වෙත ඉදිකිරීම් පැවරීම මඟින් දේශීය සේවකයන්ගේ අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම.

(ආ) අධිවේගී මාර්ග ඉදිකිරීම් වලට අදාල පිරිවැය, අධිකාරීන් විසින් විමර්ෂණයට ලක් නොකිරීම.

(ඇ) සැලැස්ම අදාල අධිකාරීන් මඟින් අනුමත කර නොගැනීම සහ පරිසර බලපෑම් තක්සේරුවක් සිදු නොකිරීම.

(ඈ) ගැටෙන අයිතිවාසිකම්

(ලකුණු 20)

02. "කාර්ය පටිපාටිය සම්බන්ධ නිසි කාර්යාවලිය (Due process) පිළිබඳ මූලධර්ම තීරණවලට මූලික වන හුදු කාර්යපටිපාටික පියවර වලට පමණක් සීමා නොවන අතර, එම තීරණයට පදනම් වන කරුණු පාලනය කිරීම දක්වා ද පැතිරේ."

*Minister of Immigration and Ethnic Affiars v. Poch(1980)*31 A.L.R.666(F.C.Aust.)p.687- 688

ස්වභාවික යුක්ති මූලධර්ම ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

\- හිමිකම් ඇව්රිණි. -

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LL.B DEGREE PROGRAMME – LEVEL V**
**CONTINUOUS ASSESSMENT TEST II– 2014/2015**
**LWU3311 – ADMINISTRATIVE LAW**
**DURATION: 03 HOURS**

**DATE: 12th November 2015** **TIME: 09.30 a.m. – 10.30a.m.**

**Answer one (01) question only**

**Candidates will be penalized for illegible handwriting.**

01. Discuss the legality of the following actions taken by the Road Development Authority of Restoria. Your answer should be supported with relevant authorities.

The Road Development Authority (RDA) of Restoria is empowered by the Road Development Authority Act 1980 to take action to construct highways in the state of Restoria. According to the Act, the RDA has to obtain approval from relevant authorities for construction of highways. Further Section 5 of the Act states as follows:

a. The RDA shall call for tenders from qualified constructors within the country.
b. The design shall be reviewed for cost effectiveness and approved by the relevant divisions of the RDA.
c. The length of bridges if necessary, the height of embankments and the depth of cuts of these projects should be reviewed if final costs are unjustifiably high.
d. An environment impact assessment shall be carried out before signing the contract.

The RDA has decided to construct the north-south highway. It called for tenders and signed a contract with ABC Construction Company based in Restoria. After six months from the date of commencement of work the RDA terminated the contract with the ABC Company and signed a new contract with a foreign company in which the Minister of Highways of Restoria is a major shareholder.

A public protest was organized against the north-south high way construction by an organization called *Save the State*. The protest was based on the following grounds:

(a) Assigning the construction to a foreign company denies the rights of local employees.

(b) The highway construction cost has not been reviewed by the authorities.

(c) The design was not approved by the relevant authorities and an environment impact assessment was not carried out.

(d) Conflict of interest.

**(20 marks)**

02. "Principles of procedural due process are not restricted to purely procedural steps which are preliminary to decisions but extend to control the material upon which the decision itself can properly be based".

*Minster of Immigration and Ethnic Affairs v. Poch*(1980) 31 A.L.R. 666(F.C.Aust.).p, 687-688.

Critically discuss the above statement in the light of the natural justice principles.

**(20 marks)**

*** *Copyrights reserved* ***